**ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගම - 2021**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව,

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් සමාගම විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කන්තලේ ව්‍යාපෘතිය යටතේ ආරක්ෂණ වේලි ඉදිකිරීම සඳහා එකතු කරගත් මුදලට වඩා සමාගම විසින් ඉකුත් වර්ෂයේ රු.16,235,670 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.4,319,176 ක් ලෙස එකතුව රු.20,554,846 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එම වටිනාකම් වියදම් ලෙස ගිණුම්ගත නොකර “අත්තිකාරම් කන්තලේ” ගිණුමට හර කර තිබුණි. | කන්තලේ වැලි ව්‍යාපෘතිය මෙම වසරේදී අවසාන කිරීමට අදහස් කෙරෙන අතර එහිදී සියළු වැලි කියුබ් ප්‍රමාණයන් විකිණීමෙන් අනතුරුව ආරක්ෂණ වේලි සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල වියදමක් ලෙස ලාභයෙන් කපාහැරීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් හා වියදම් නිසි පරිදි ගිණුම්වල දැක්විය යුතු අතර ආදායමට වඩා වියදම් කිරීමට කටයුතු නොකළ යුතුය. |
| (ආ) | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 17.19 ඡේදය ප්‍රකාර සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.79,803,562 ක් වූ ජංගම නොවන වත්කම් සමාගම විසින් අඛණ්ඩව භාවිතයට ගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනවල සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම සඳහා වත්කම්වල ඵලදායි ජීවිත කාලය හා සුන්බුන් වටිනාකම නැවත තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. | ධාරණ අගය හා සාධාරණ වටිනාකම් අතර ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි අයිතම කිහිපයක් අප විසින් හඳුනාගෙන ඇත. වර්තමානය වන විට වෙළඳපොල වටිනාකම ඉහළ ප්‍රතිශතයන්ගෙන් වෙනස් වී ඇතැයි සැලකිය හැකි මෝටර් වාහන හා යන්ත්‍රෝපකරණ පමණක් නැවත වටිනාකම් තක්සේරු කිරීමට කටයුතු කරමි. කෙසේ වෙතත් මෙහිදී ස්ථාවර වත්කමේ | ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | වටිනාකමට වඩා වැඩි මුදලක් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සඳහා වැය වන ස්ථාවර වත්කම් නොසලකා ඉහතින් සඳහන් කරන ලද ඉහල වටිනාකමින් යුතු මෝටර් වාහන හා යන්ත්‍රෝපකරණ පමණක් නැවත තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සඳහා නිසි ක්‍රමවේදයක් ඔස්සේ සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ වැලි ව්‍යාපෘතිවල පැවති වැලි ශේෂයන් භෞතිකව සත්‍යාපනය නොකර පොත්වල පැවති ශේෂයන් පදනම් කර ගෙන ඉතිරි වැලි තොගවල වටිනාකම රු.12,123,460 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පැවති භෞතික තොගය ඒ ඒ කාර්යභාර නිලධාරී විසින් සහතික කර අප වෙත ලබාදී ඇත. කෙසේ වෙතත් දැනට මෙහෙයුම් කටයුතු සිදු නොවන ව්‍යාපෘතීන් වල පෙන්නුම් කරනු ලබන තොග ශේෂයන් පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු කරමින් ඉදිරියේදී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තොග භෞතිකව සත්‍යාපනය කර තොගවල නිරවද්‍යතාවය තහවුරු කර ගත යුතුය. |
| (ඈ) | සමාගම වෙත රු.43,954,503 ක ඉංජිනේරුමය සේවා සැපයීමේ කොන්ත්‍රාත්තුවක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල ඉන් රු.13,198,351 ක මුදලක් ලැබී තිබූ අතර මෙම මුදල අත්තිකාරම් ගිණුමකට බැර කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ වැඩ කොටස් ඉටු කිරීම සඳහා සමාගම විසින් වෙනත් සමාගමකට රු.8,404,546 ක් හා සමාගමේ නිලධාරීන්ට ප්‍රවාහන වියදම් සහ වැටුප් ලෙස රු.1,745,004 ක්ද ගෙවා තිබූ අතර සමාගමේ ආදායම් හා වියදම් නිසි හඳුනා ගැනීමකින් තොරව මෙම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම ව්‍යාපෘතිය සඳහා බදු නිදහස්වීම් (Tax Exemptions) සම්බන්ධ කාරණා නිරවුල් කර ගැනීම 2022 මාර්තු මුල් සතිය වන තෙක් කල්ගත වූ අතර ඊට පෙර අවසාන ගිණුම් පිළියෙල කරන ලදී. එම හේතුවෙන් 2021.12.31 දක්වා ලද මුදල් ලැබීම් අත්තිකාරම් ගිණුමටද ඒ දක්වා දරණ ලද වියදම් ප්‍රවර්ථන වර්ෂයේ වියදම් ලෙසද ගිණුම්ගත කරන ලදී.<br>වර්තමානයේ ලද අත්තිකාරම් මුදල බදු ගැටළු නිරාකරණය වීමෙන් පසුව ව්‍යාපෘති කාර්යයන් නිම කිරීමේ අදියරයන් මත ප්‍රතිශතාත්මකව අප්‍රේල් මාසයේදී ආදායමට ගෙන ඇත. | ආදායම් හා වියදම් නිවැරදිව හඳුනාගෙන නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුල මුදලින් ගෙවන ලද ආදායම් බදු ප්‍රමාණය රු.7,016,486 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.14,735,916 ක් ලෙස රු.7,719,430 කින් වැඩිපුර දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව අප විසින් ගෙවූ බදු ප්‍රමාණය ලෙස රු.14,735,916 ලෙස පෙන්වා ඇති අතර ස්වතක්සේරු ක්‍රමය යටතේ 2021 වර්ෂයට කාර්තු දෙකක් සඳහා රු.7,016,486 ක් ගෙවා ඇත. මෙලෙසෙ ස්වතක්සේරු ක්‍රමය යටතේ කාර්තු දෙකක් නොගෙවා | මුදලින් කරනු ලැබූ වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කල යුතුය. |

| | | |
|---|---|---|
| | ඇත්තේ ඒ දක්වා ස්වතක්සේරු පදනම මත වැඩිපුර ගෙවා ඇති බදු ප්‍රමාණයක් පැවතීම හා ඊට පෙර වර්ෂය අලාභ ලබා තිබීම හේතුවෙනි. | |

**1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**
**------------------------------------**

**1.7.1 ලැබිය යුතු මුදල්**
**------------------**

| විගණන නිරීක්ෂණය<br>------------------------ | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලැබිය යුතු හා කාර්යාංශයට ගෙවිය යුතු ශේෂ ලෙස පිළිවෙලින් රු.4,698,378 ක් හා රු.1,513,857 ක් ගිණුම්වල දක්වා තිබුණි. කාර්යාංශයේ සනාථ කිරීම් වලට අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.3,267,161 ක් හා රු.27,360,000 ක් විය. ඒ අනුව පිළිවෙලින් රු.1,431,017 හා රු.25,846,143 ක වෙනසක් නිරීක්ෂණය විය. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් ලැබිය යුතු හා ඔවුන් හට ගෙවිය යුතු ගෙවිය යුතු ශේෂයන් පිළිබඳව දෙපාර්ශවය එකඟතාවයකට පැමිණීම සඳහා සභාපතිතුමාගේ මූලිකත්වයෙන් ඉදිරියේදී පැවැත්වීමට නියමිත සාකච්ඡා වාර අවසානයේ ගත යුතු ක්‍රියාමාර්ග අනුව අයකර ගැනීම, හිලව් කර ගැනීම හෝ කපා හැරීම සිදුකරනු ලැබේ. | දෙපාර්ශවය සමඟ එකඟතාවයට පැමිණ ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ නිරවුල් කරගත යුතුය. |
| (ආ) | ණය අයකර ගැනීමේ හැකියාව පරීක්ෂා කිරීමකින් තොරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අයවිය යුතුව තිබූ රු.7,012,211 ක් හානිකරණ අලාභ සඳහා වෙන්කර තිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ රු.51,096,767 ක් වූ ණයගැති ශේෂය තුළ වර්ෂ 05 ට වැඩි රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු ශේෂවල එකතුව රු.16,762,257 ක් වූ අතර 2022 මාර්තු 31 විගණිත දින වන විට මෙම ශේෂයන් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | රාජ්‍ය ආයතන වැඩි ප්‍රමාණයක් පිළිතුරු ලිපි නොඑවීම මත මෙම ශේෂයන් සම්බන්ධ ගතයුතු ක්‍රියාමාර්ග අවිනිශ්චිතවී ඇති අතර පවතින ලේඛනවල ඇති දුර්වලතා නිසා එම ලැබිය යුතු ශේෂ දැඩි ලෙස ඉල්ලා සිටීමටද හැකියාවක් ලැබී නොමැත. කෙසේ වෙතත්, මෙම ශේෂ අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් මත කපා හැරීම හැර වෙනත් විකල්පයක් නොපවතින බවද පෙනී යයි. | -එම- |
| (ඈ) | මුලතිව් බොරළු ව්‍යාපෘතිය 2015 වර්ෂයේ අවසන් වී තිබූ අතර එම ව්‍යාපෘතිය සඳහා මුලතිව් දිසා වන නිලධාරී වෙත 2014 වර්ෂයේ තැන්පත් කරන ලද රු.400,000 ක මුදල නැවත ලබාදෙන ලෙස 2021 අගෝස්තු 10 දින ඉල්ලා තිබුණත් එය ලබාදී නොතිබුණි. | ශේෂය නිදහස් කිරීමට වාචිකව කැමැත්ත දැක්වුවද මේ වන තෙක් ගෙවා නොමැති අතර මේ පිළිබඳව දිගින් දිගටම කටයුතු කරමින් සිටී. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාගම විසින් යාන්ඔය ව්‍යාපෘතියේ වැලි කැණීම සඳහා කියුබ් 1423 වෙනුවෙන් රු.999,946 ක මුදලක් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ගෙවා තිබූ අතර ඉන් වැලි කියුබ් 974 පමණක් කැණීම් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2018 වර්ෂයෙන් පසු ක්‍රියාත්මක නොවූ අතර වැලි කියුබ් 449 සඳහා වැඩිපුර ගෙවූ රු.454,506 ක මුදල නැවත ලබාදෙන ලෙස 2021 දෙසැම්බර් 01 දින දන්වා තිබුණත් ලබාදී නොතිබුණි. | රාජ්‍ය ආයතනයක් වශයෙන් අප විසින් ඉල්ලීම් කළද ඔවුන්ගේ ආයතනික ප්‍රතිපත්තිය අනුව ගෙවීම අපහසු බව දන්වා සිටින ලදි. | -එම- |
| (ඊ) | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ මානව සම්පත් අවශ්‍යතාවය සහ පුහුණු වීම් සම්බන්ධව ඇගයීමක් සිදුකල උපදේශකවරයෙකු සඳහා 2018 වර්ෂයේදි රු.400,000 ක මුදලක් සමාගම විසින් ගෙවා තිබූ අතර මෙම මුදල මේ දක්වා කාර්යාංශයෙන් අයකරගෙන නොතිබුණි. එමෙන්ම යාන්ඔය ව්‍යාපෘති කාර්යාලය මෙන්ම යාන්ඔය ගොඩනැගිල්ල සහ සේවක නවාතැන් සඳහා සමාගම වසින් ගෙවා තිබූ රු.150,000 ක මුදලක් ද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අයකර ගෙන නොතිබුණි. | භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් අප වෙත ලැබිය යුතු මුදල අයකර ගැනීම සඳහා අවස්ථා කිහිපයකදීම අදාළ සියළු ලිපි ලේඛන සමඟ ලිඛිතව දැනුම්දීම් සිදුකළ ද මේ වන තෙක් ඒ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත. ඉදිරියේදී දෙපාර්ශවය පොදු එකඟතාවයකට පැමිණීමට බලාපොරොත්තු වේ. | -එම- |
| (උ) | 2010 – 2021 කාලය තුල සමාගමෙන් විවිධ සේවා සපයා ගැනීම සඳහා ආයතන හා පුද්ගලයන් විසින් සමාගම වෙත ලබාදුන් එකතුව රු.41,161,688 ක අත්තිකාරම් වටිනාකම තුල වර්ෂ 5 ඉක්මවූ අත්තිකාරම් වල වටිනාකම රු.5,586,101 ක් විය. මෙම අත්තිකාරම් 2022 මාර්තු 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ප්‍රකාරව සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | වැලි ව්‍යාපෘති 5 ක් සඳහා ලබාගත් කැණීම් බලපත්‍ර වෙනුවෙන් 2018 වර්ෂයේ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයට ගෙවිය යුතු රාජ්‍යභාග නියමිත කාලය තුල නොගෙවීම නිසා ගෙවිය යුතු රු.1,513,857 ක දඩ මුදලක් සමාලෝචිත වර්ෂයේදී ද ගෙවා නොතිබුණි. | මව් සමාගම විසින් එසේ දඩ මුදලක් පනවා තිබූ අතර එය ඉවත් කර ගැනීම සඳහා අප විසින් ඉල්ලීම් සිදුකළද ඒ සඳහා මෙතෙක් යහපත් ප්‍රතිචාරයක් ලබාදී නොමැත. | දෙපාර්ශවය අතර එකඟතාවයකට පැමිණ නිරවුල් කරගත යුතුය. |

## 1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) 5.1.2 ඡේදය | සමාගම විසින් සකස් කර තිබූ සංයුක්ත සැලැස්මේ, ආයතනයේ දැනට පවතින සම්පත්, සංවිධාන ව්‍යුහය හා සැලසුම් කාලය තුළ ළඟා කරගත යුතු අරමුණු ඉලක්ක සහ වගකීම් පැහැදිලිව ඇතුලත් කර නොතිබුණි. | සංයුක්ත සැලැස්ම පිළියෙල කරන කාලපරිච්ඡේදයේදී ආයතනික ව්‍යුහයක් නොතිබූ අතර මේ වන විට ආයතනික ව්‍යුහයක් සකස් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම පිණිස අදාල ආයතන වෙත යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) 8.3.9 ඡේදය | සමාගම වෙත බඳවා ගන්නා ලද සේවකයින් දෙදෙනෙකු 2020 සැප්තැම්බර් 10 දින සිට පරිසර අමාත්‍යාංශයට අනුයුක්ත කර රු.283,240 ක් වූ වැටුප් හා දීමනා සමාගමෙන් ගෙවා තිබුණි. | අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන්වල ප්‍රගතිය විමසා බැලීමට මෙන්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල සිදුකරනු ලබන ව්‍යාපෘති හා වැඩසටහන් සම්බන්ධයෙන් මහජනතාව මත පුළුල් මාධ්‍ය ප්‍රචාරණයක් ලබාදීම සඳහා අමාත්‍යාංශය තුල ඒකාබද්ධ පසුවිපරම් හා මාධ්‍ය ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන හෙයින් අප සමාගමට අදාළව සිදු කරනු ලබන ඉහත රාජකාරී කටයුතු සඳහා සුදුසු නිලධාරීන් දෙදෙනෙකු තාවකාලික පදනම මත අනුයුක්ත කරන ලෙස ඉල්ලා ඇත. | -එම- |
| (ආ) | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලිය | | | |
| | (i) 12 වගන්තිය | ශ්‍රී ලංකාවේ වෙනත් තැන්වල නව සහ පවතින ඛනිජ ආශ්‍රිත කර්මාන්ත වෙත යාවත්කාලීන භූ විද්‍යාත්මක දත්ත සහ | ශ්‍රී ලංකාවේ හෝ වෙනත් ස්ථානයක් සඳහා කැණීම් හා ඛනිජ කර්මාන්තය වෙනුවෙන් යම් සේවාදායකයෙකු විසින් ඉල්ලා සිටින භූ විද්‍යාත්මක දත්ත සහ | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තොරතුරු සැපයීම සඳහා පද්ධතියක් සකස් කර නොතිබුණි. | තොරතුරු ලබාදීම, එම තොරතුරු ගවේෂණ ව්‍යාපෘතියේ පවතින කාර්යභාරය මත සේවාදායකයාගේ මුදල් අයකර ගැනීමේ වාණිජමය ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කර අදාල දිනය දක්වා යාවත්කාලීන වූ තොරතුරු ලබාදීමේ හැකියාව සමාගම සතුවේ. | |
| (ii) 19 වගන්තිය | ඛනිජ ආශ්‍රිත සහ අනෙකුත් ආශ්‍රිත කර්මාන්ත සඳහා කළමනාකරණ සහ ලිපිකරු සේවා සැපයීම අරමුණක් වුවද ඛනිජ ආශ්‍රිත කර්මාන්ත පවත්වා නොයන ශ්‍රී ලංකාවේ ඛනිජ නියාමන ආයතනය ලෙස කටයුතු කරන භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙත සේවකයන් 55 දෙනෙකු සපයා සියයට 10 ක ලාභයක් සමාගම තබා ගෙන තිබුණි. | ජීඑස්එම්බී තාක්ෂණ සේවා (පුද්) සමාගමේ සමාගමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි ආයතනයේ අභිමතය පරිදි වෙනත් ආයතන වෙත සේවකයින් සේවයේ යෙදවිය හැකි බව සඳහන් කර ඇත.<br>ඒ අනුව සමාගම සියයට 10 ක ලාභයක් සහිතව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ ලිඛිත ඉල්ලීම මත සේවකයින් එම සේවකයින් ආයතනය වෙත අනුයුක්ත කර ඇත. | සමාගමේ සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූලව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.11,509,597 ක ලාභය ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අලාභය රු.43,290,584 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.54,800,181 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මනම්පිටිය, බෙල්අත්ත හා නිදන්වල වැලි ව්‍යාපෘතිවල ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. වටිනාකම රු.127,138,489 ක් වූ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද රු.3,386,251 ක් වටිනා භාණ්ඩ මිලදී ගෙන තිබූ අතර ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මෙහි අන්තර්ගත කරන ලද අයිතමයන් මිලදී නොගැනීම පිළිබඳ තීරණයක් එම වර්ෂ අවසාන වන තෙක් නොගෙන තිබීම හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 විධිවිධාන අනුව අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලසුමෙහි ලැයිස්තුගත කිරීම සිදුකල යුතු වුවද අප ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ස්වභාවය අනුව එය තරමක අපහසු කටයුත්තකි. | |
| (ආ) | දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ මුලතිව් දිස්ත්‍රික්කයේ වැව් 75 ක ඉංජිනේරු මිනුම් කටයුතු කිරීම සඳහා රු.43,954,503 ක කොන්ත්‍රාත්තුවක් සමාලෝචිත වර්ෂයේ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සමාගම වෙත ලබාදී තිබූ අතර මෙම කොන්ත්‍රාත්තුව යටතේ සිදු කළ යුතු සියළුම වැඩ කොටස් මිල ගණන් කැඳවීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත බද්ධ ව්‍යාපාර ගිවිසුමක් මත වෙනත් සමාගමකට ලබාදී තිබුණි. | මිල ගණන් කැඳවීමේ ක්‍රියාපටිපාටියක නියැළුණේ නම් ඒ සඳහා මාසයකට ආසන්න කාලයක් වැය විය හැකි බවට හැඟී ගිය හෙයින් සහ සමාගම් වරම අනුව ඒකාබද්ධ ව්‍යාපෘති පවත්වාගෙන යාමට හැකියාව පැවති හෙයින් මේ සඳහා ක්ෂේත්‍රයේ අත්දැකීම් සහිත ප්‍රවීනයන් හා උපකරණ පවතින පාර්ශවයන් තෝරාගෙන ඔවුන් සමඟ ඒකාබද්ධ ගිවිසුමක් මගින් මෙම ව්‍යාපෘතියට ලංසු ඉදිරිපත් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදි. ඔවුන් වෙත ඉංජිනේරු මැනුම් සමීක්ෂණ කටයුතු පමණක් පවරා ඇති අතර එහි අනෙක් කර්තව්‍ය වන පාංශු සමීක්ෂණ කටයුතු සිදු කිරීමට පූර්ණ හැකියාව ආයතනයේ භූ විද්‍යා අංශය සතුව පවතී. | ප්‍රසම්පාදන කාර්ය පරිපාටිය අනුගමනය කල යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) මනම්පිටිය වැලි ව්‍යාපෘතිය** | | |
| (i) වැලි ගොඩදැමීමේ සහ නිකුත් කිරීමේ ක්‍රමවේදයක් සකස් කර තිබුණත් ඒ සඳහා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසුව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ අත්සන සහිතව අභ්‍යන්තර චක්‍රලේඛයක් ලෙස නිකුත් කර නොතිබුණි. | ව්‍යාපෘති අරමුණු ඉටුවන පරිදි සකස් කරන ලද ක්‍රියාකාරී උපදෙස් මාලාවක් ජොෂ්ඨ කළමනාකාරුත්වය විසින් ව්‍යාපෘතිය වෙත නිකුත් කර ඇත. | වැලි ගොඩදැමීමේ සහ නිකුත් කිරීමේ ක්‍රමවේදය අභ්‍යන්තර චක්‍රලේඛයක් ලෙස නිකුත් කළ යුතුය. |
| (ii) මංකඩලාභීන් හා සමාගම අතර වැලි ගොඩ දැමීම සඳහා ඇතිකර ගත් ගිවිසුම් ගණනාවක සමාගම වෙනුවෙන් කිසිදු පුද්ගලයෙකු අත්සන් තබා නොතිබීම හා | යාවත්කාලීන වූ ගිවිසුම් සියල්ල කළමනාකරු විසින් අත්සන් තැබීමට කටයුතු සිදුකරමින් පවතී. | ගිවිසුම නීත්‍යානුකූල වීමට නිසි පරිදි සම්පූර්ණ කර අදාල පාර්ශවයන් අත්සන් තැබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමහර ගිවිසුම් සඳහා දෙපාර්ශවයම අත්සන් තබා නොතිබුණි. එමෙන්ම එම ගිවිසුම්වල මාසිකව කැණීම් කර භාරදිය යුතු වැලි ප්‍රමාණයක් සඳහන්ව නොතිබුණි. | | |
| (iii) | කියුබ් 1 ක් සඳහා රු.4,830 ක්ව පැවති වැලි මිල රු.6,450 දක්වා රු.1,620 කින් වැඩිකර ඉන් රු.1,000 ක් වැලි ගොඩදමන කම්කරුවන් සඳහා ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණත් එම මුදලින් රු.600 ත් - රු.800 ත් අතර මුදලක් වැලි මංකඩ ලාභීන්ට ගෙවමින් පැවතුණි. එසේම පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිටත දිස්ත්‍රික්කවල පවතින ඉහල වැලි මිල පාලනය කිරිම සඳහා පාරිභෝගික සේවා අධිකාරිය සමග එක්ව පාලන මිලක් පැනවීම කෙරෙහි සමාගමේ අවධානය යොමු වී නොතිබුණි. | මෙම ව්‍යාපෘතියට ඍජු කම්කරුවන් බඳවාගෙන ව්‍යාපෘතිය පවත්වාගෙන යාමේදී ඔවුන්ගේ ස්ථාවර සේවයක් ලබා ගැනීම මහත් ගැටලුවක්ව පැවතුණි. ඔවුන් හට අවශ්‍ය වන යටිතල පහසුකම් ලබා දීමේදී ඇතිවන ගැටළු ඒවාට ප්‍රධන හේතු වේ.<br>එම නිසා ව්‍යාපෘතිය වඩා ස්ථාවර අන්දමින් ක්‍රියාත්මක වු 2008-2015 වර්ෂය දක්වා පැවති මංකඩලාභීන් යටතේ මෙම වැලි ගොඩදැමීමේ ක්‍රියාවලිය නැවත ක්‍රියාත්මක කිරීමට කළමනාකාරිත්වය තීරණය කර තිබුණි.<br>ඒ අනුව පෙර ක්‍රමවේදයටම මංකඩලාභීයා මංකඩ වෙතට කම්කරුවන් සහ ඔවුනට අවශ්‍ය යටිතල පහසුකම් සපයා දීම සඳහා සියළු ගෙවීම් ඔහු වෙත සිදු කරන අතර කම්කරුවන්ට සාධාරණ වේතනයක් ලැබිය යුතු අතර මංකඩලාභියා සපයන යටිතල පහසුකම් වල වියදම් ආවරණය කර ගැනීමටද මුදලක් වෙන්විය යුතු බැවින් මෙලෙස මංකඩලාභියා සහ කම්කරුවා වෙත සිදුවන ගෙවීම්වල විභේදනය පෙන්නුම් කර ඇත. | අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මෙම වැලි ව්‍යාපෘතිය සඳහා කැණීම් බලපත්‍ර 211 ක් ලබාගෙන තිබු අතර ඒ යටතේ වැලි මංකඩ 211 ක් ක්‍රියාත්මක විය යුතු වුවත් වැලි මංකඩ 144 ක් පමණක් ක්‍රියාකාරි මට්ටමේ පැවතුණි. වැලි මංකඩ 61 ක් සඳහා මංකඩ ලාභීන් පත්කර තිබුණත් ඒවා ක්‍රියාත්මක වී නොතිබු අතර වැලි මංකඩ 06 ක් සඳහා මංකඩ ලාභීන් පත්කර නොතිබුණි. | මෙහි සඳහන් පරිදි අක්‍රීය බලපත්‍ර වලට අදාල මංකඩයන් බැවින් ඒවායේ ක්‍රියාකාරිත්වය නැවත වැලි නිධි තැන්පත් වීම සමඟ ආරම්භ වීමට නියමිත අතර මේ වන විට මෙම මංකඩයන් වලින් වැලි නිෂ්පාදනය සිදු වෙමින් පවතී. | වැලි මංකඩ සඳහා මංකඩලාභීන් පත්කර ක්‍රියාකාරී මට්ටමේ පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (v) | මෙම ව්‍යාපෘතිය යටතේ කැණීම් කරන වැලි ප්‍රමාණයෙන් සියයට 85 ක් ටෝකන් ක්‍රමය යටතේ ලබාදෙන අතර ටෝකන් ක්‍රමය යටතේ ලබාදෙන වැලි ප්‍රමාණයෙන් සියයට 60 ක් පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල | අවසන් පාරිභෝගිකයා හට සාධාරණ මිලකට වැලි නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ව්‍යාපෘතියක් වන අතර කුමන හෝ කාණ්ඩයක් යටතේ ව්‍යාපෘතියේ ලියාපදිංචි වී ඇති ලොරි රථ වලට වැලි පැටවෙන වාර ගණන | සාධාරණ පදනමක් ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලියාපදිංචි කියුබ් 03 සහ ඊට වැඩි ලොරි සඳහා ද, සියයට 20 ක් පොලොන්නරුව තුල ලියාපදිංචි කියුබ් 03 ට අඩු ලොරි සඳහා ද, සියයට 20 ක් දිස්ත්‍රික්කයෙන් පිටත ලොරි සඳහා ද ලබා දෙමින් පැවතුණි. පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ලියාපදිංචි කියුබ් 03 සහ ඊට වැඩි ලොරි 749 ක් වැලි ලබා ගැනීම සඳහා ලියාපදිංචි වී ඇති නිසා එක් වැලි පැටවීමක් ලබා ගැනීමට ලොරි රථයකට දින 16-21 අතර කාලයක් ගතවී තිබුණි. එමෙන්ම පොළොන්නරුව දිස්ත්‍රික්කයෙන් පිටත ලොරි රථ 172 ක් වැලි ලබා ගැනීමට ලියාපදිංචි වී ඇති අතර එම ලොරි රථ සඳහා එක් වැලි පැටවීමකින් පසුව නැවත වැලි පැටවීමක් ලබා ගැනීමට මාස 06 ක කාලයක් ගතවී තිබුණි. | සම්බන්ධයෙන් ආයතනය බැඳී නොසිටී. මෙහි සඳහන් කාල පරාසයන් ටෝකන් ක්‍රමවේදය යටතේ වැලි ලබා ගැනීමට ගතවන කාල පරාසය වන අතර මින් බොහාමයත් ලොරි රථ ආයතනය විසින් පාලන මිල යටතේ නිකුත් කරන වැලි සුපයුම් සඳහා දායක වී මෙම වාර ගණනට වඩා වාර ගණනක් වැලි පැටවීම සිදුකරනු ලැබේ. | |
| (vi) මනම්පිටිය පාලමට ඉහල ප්‍රදේශයේ වර්ෂයේ මාස 06-07 අතර කාලයක් තුල ගඟේ ජල මට්ටම අඩුවන අවස්ථාවල ගඟ මැද තැන්පත් වී ඇති විශාල වැලි නිධි කරා බෝට්ටුවලින් යාමට නොහැකි වීම නිසා එහි වැලි ඉවත් කිරීමට අපහසු බව මංකඩ හිමියන්ගේ සංගම් විසින් විෂය භාර අමාත්‍යවරයා වෙත ලිඛිතව දන්වා තිබුණි. මෙම වැලි නිධි ඉවත් කිරීම සඳහා වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පසු විපරම් කමිටු වාර්තාවට අනුව Convey Belt ක්‍රමයෙන් පාවිච්චි කිරීම සුදුසු බව නිර්දේශ කර තිබුණද ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මනම්පිටිය ජාතික වනෝද්‍යානය තුල වැලි කැණීම් බලපත්‍ර නිකුත් කිරීමට නීතිමය හැකියාවක් පසුබිමක ශ්‍රේෂ්ඨාධිකාරණ තීන්දුවකට අනුව මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදී ඇති අතර සියලු කැනීම් කටයුතු ශිල්පිය කැණීම් බලපත්‍ර ප්‍රකාරව සිදුවිය යුතුය. | වැලි ඉවත් කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතුය. |
| (vii) වැලි ගොඩ දමන කම්කරුවන් සඳහා මංකඩලාභීන් විසින් රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කම්කරුවන් පදනම් කරගෙන සිදුකරන “පුලතිසි රන් දහඩිය” නම් වූ සුභසාධන වැඩසටහන යටතේ කමුකරු වන්දිය පනත ප්‍රකාරව ජීවිත හානි රක්ෂණාවරණයක් ලබා දීමට සැලසුම් කරමින් පවතී. | රක්ෂණාවරණයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (viii) සමාගමේ වැලි අංගන සඳහා සියයට 10 ක්ද ප්‍රධාන කාර්යාලයේ අනුමැතීන් මත සියයට 05 ක්ද වැලි ලබා දෙන නමුත්, නියමිත ප්‍රමාණයට වඩා සියයට 50-75 අතර වැඩි ප්‍රමාණයකින් වැලි අංගන වෙත සහ ප්‍රමුඛතා පදනම වන | වැලි නිකුත් කිරීමේ ක්‍රමවේදය යටතේ නිශ්චිත ප්‍රතිශත බෙදා වෙන් කිරීමක් සඳහන් වුවද එම ප්‍රතිශතය වෙනස් වීම් සහිත වැලි නිකුත් කිරීම ව්‍යාපෘතියේ මූදිලක අරමුණක් වන වැලි මිල පාලනය කිරීම සඳහා ගනු ලැබූ | නිශ්චිත ක්‍රමවේදයට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වැලි නිකුත් කර තිබුණි. | පියවරක් වන අතර ටෝකන් ක්‍රමවේදය යටතේ නිකුත් කරන වැලි අවසාන පාරිභෝගිකයා වෙත ලඟවීමේදී එහි මිල පාලනයක් ආයතනය සතුව නොපවතී. | |
| (ix) ගං ඉවුර සහ වැලි කැණීමේ මාර්ග පුනරුත්ථාපනය කිරීම සඳහා වැලි කියුබ් 01 කින් අයකරන රු.40 ගාස්තුව රු.100 දක්වා වැඩිකර තිබුණි. මේ යටතේ 2021 ඔක්තෝබර් 31 දිනට රු.16,782,443 ක මුදලක් එකතු වී තිබුණත් අදාල කාලය තුල රු.100,100 පමණක් වැයකර තිබුණි. වැලි කැණීම් භූමි වෙත ප්‍රවිශ්ඨ වන මාර්ග ඉතා අබලන් තත්ත්වයක පැවතුණත් එම මාර්ග අළුත්වැඩියා කර නොතිබුණි. | පුනරුත්ථාපන අරමුදල යටතේ මාර්ග ප්‍රතිසංස්කරණයට ටෙන්ඩර් කැඳවීමට මේ වන විට කටයුතු යොදා ඇති ඇති අතර ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 6 කට ආසන්න වේ. | එකතු කරගනු ලබන මුදල් අදාල කාර්යයන්ට භාවිතා කළ යුතුය. |
| (x) මෙම ව්‍යාපෘතිය සඳහා 2009 වර්ෂයේ රු.8,883,520 කට මිලදී ගත් ලෝඩර් යන්ත්‍රයක් කාර්මික දෝෂ හේතුවෙන් 2012 වර්ෂයේ භාවිතයෙන් ඉවත් කර තිබුණි. 2019 වර්ෂයේදී එය නැවත රු.966,595 ක් වැයකර අළුත්වැඩියාවක් කර තිබුණත් එය යථා තත්ත්වයට පත්කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම යන්ත්‍රය ව්‍යාපෘති භූමියේ අනාරක්ෂිතව ගාල් කර තැබීම නිසා එහි කොටස්වල මල බැඳීම් සිදුවී තිබූ අතර රු.2,423,224 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රයක් කිසිදු ආවරණයක් නොමැතිව වැසි ජලය සහ හිරු රශ්මියට නිරාවරණය වෙමින් අබලන් තත්ත්වයක පැවතුණි. | මෙවැනි යන්ත්‍ර වල සිදුවන සීරීම්, මළබැඳීම් මගින් යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වයට බාධාවක් ඇති නොකරයි. | වත්කම්වල ආරක්ෂාව තහවුරු කළ යුතු අතර කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කල යුතුය. |
| (ආ) **කන්තලේ වැලි ව්‍යාපෘතිය** | | |
| (i) මෙම ව්‍යාපෘතිය යටතේ කැණීම් කර වැලි ගබඩාවක් වෙත ප්‍රවාහනය කර තිබූ වැලි කියුබ් 46,306 ක ප්‍රමාණයෙන් වැලි කියුබ් 41,773 ක් විකුණා තිබූ අතර ඉතිරි වැලි අලෙවි නොකර මාස 10 ක පමණ කාලයක් තිබීම නිසා සුළු වශයෙන් රොන්මඩ කලවම් වී තිබූ අතර ඉතිරි කියුබ් 4533 ක ප්‍රමාණය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි. මෙම ස්ථානයේ වැලි කියුබ් 1000 කට අඩු ප්‍රමාණයක් පමණක් පවතින බව ටෙන්ඩර්කරුවන් විසින් දන්වා තිබූ අතර එහි තිබූ වැලි කියුබ් 875 ක ප්‍රමාණයක් | කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත පරිදි මඩ මිශ්‍ර වැලි සෝදා විකිනීමට එකඟ වූ නමුත් එම සෝදා අලෙවි කල යුතු වැලි ඉතුරු කර මද වශයෙන් මඩ මිශ්‍ර වැලි පමණක් අලෙවි කර තිබුණි. එබැවින් භූමියේ අන්තර්ගත සියලු වැලි ලබා නොගැනීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් තැන්පත් කල ආරක්ෂණ තැන්පතුව නිදහස් නොකිරීමට ආයතනය විසින් කටයුතු කර ඇත. එසේ සේදීමට ඇති වැලි වලින් කොටසක් මේ වන විට එම භූමියේ එකතු කර ඇති අතර තවත් | විධිමත් ක්‍රියාමාර්ගයක් අනුගමනය කර ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ටෙන්ඩර්කරුවකු වෙත විකුණා තිබුණි. ඒ අනුව වැලි කියුබ් 3658 ක ඌනතාවයක් පැවති අතර එම වැලි තොගයේ පිරිවැය රු.12,107,980 ක් විය. | එකතු කිරීමට ඇත. | |
| (ii) | වැලි මිලදීගත් ගැණුම්කරු සුළු වශයෙන් රොන්මඩ කලවම් වී තිබූ වැලි ව්‍යාපෘති භූමියේම යන්ත්‍රයක් යොදා ගෙන පිරිසිදු කර කියුබ් 01 ක් රු10,000 බැගින් විකුණන බව භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. ඒ අනුව බාහිර පාර්ශවයක් රු.මිලියන 5 කට වඩා වැඩි ලාභයක් උපයා ගෙන තිබූ බව නිරීක්ෂණය තිබුණි. | වසරකට අධික කාලයක් ව්‍යාපෘතිය අක්‍රීයව පැවති බැවින් මාසිකව දැරීමට සඅදුවන මෙහෙයුම් වියදම් නතර කිරීමට මඩ මිශ්‍ර වැලි අලවි කිරීමට අවශ්‍ය විය. අක්කර 5 ක් පුරා භූමියේ මෙම වැලි විහිදී තිබූ අතර එම වැලි එකතු කර සෝදා අලෙවි කිරීමට තිබුණි.<br><br>එබැවින් ගැනුම්කරුවෙකුට එම භූමියේ ඇති වැලි සෝදා අලෙවි කිරීමට අවස්ථාව ලබා දුන් නමුත් ගැනුම්කරුවෙකු විසින් අවම මඩ මිශ්‍ර වූ ප්‍රමාණයක් පමණක් බිම් මට්ටමේ වැලි ස්ථරය ඉතුරු කර පැටවූ බැවින් රඳවාගත් බැඳුම්කරය නිදහස් නොකිරිණි. | සමාගම ලාභ උපයා ගැනීමේ විකල්ප මාර්ග හඳුනාගෙන ලාභ උපයා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | වැලි ඉවත් කිරීමට සමගාමීව ගංවතුර ආරක්ෂණ වේලි 03 ක් ඉදිකිරීමට සැලසුම් කර රු.59,978,547 ක මුදලක් එකතු කරගෙන තිබූ අතර එම මුදල් යොදවා අංක 01 02 සහ 03 දරන බාදන වාරක ඉදිකිරීම් කර තිබුණි. එහි ඉදිකිරීම් ප්‍රගතිය පිළිවෙලින් සියයට 100, 69 සහ 53 ක් විය. | විගණන විමසුම හා එකඟ වේ. | බාදන වාරක 02, 03 කඩිනමින් ඉදිකර අවසන් කළ යුතුය. |
| (ඈ) | මූතූර් වැලි ව්‍යාපෘතිය සිදුකරන ස්ථානයේ පවතින වැලි ඉදිකිරිමේ කටයුතු සඳහා භාවිතා කරන කොන්ක්‍රීට් සඳහා සුදුසු නොවීම හේතුවෙන් මෙම ස්ථානයෙන් වැලි කැණීම් කර අදාල ඉදිකිරීම් සඳහා ලබා ගැනීමට ආරක්ෂක හමුදා මුලස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. සමාගම විසින් කැණීම් බලපත්‍ර 24 ක් ලබා ගෙන මෙම ස්ථානයේ වැලි කැණීම් සිදුකර තිබූ අතර ව්‍යාපෘතිය ආරම්භ කල 2020 අගෝස්තු 18 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලය තුල වැලි කියුබ් 1,397 ක් කැණීම් කර තිබූ අතර අදාල කාලය තුල රු.1,910,661 ක අලාභයක් සිදු වී තිබුණි. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ ලැබීමත් සමඟ කැණීම් බලපත්‍ර සඳහා 2020 මාර්තු මස තුලදීම භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතට අයදුම් කල ද එම බලපත්‍ර නිකුත් කිරීම සිදු කරන ලද්දේ ඉන් මාස 05 ක් ගත වී 2020 අගෝස්තු මාසය තුලදීය. ඉන් අනතුරුව ප්‍රදේශයට වර්ෂා සමය එළඹී හෙයින් ව්‍යාපෘතියේ කටයුතු සිදු කරගෙන යාමට අපහසු විය. ඒ අනුව මෙම වැලි කියුබ් ප්‍රමාණය පමණක් කැණීම් කිරීමට හැකිව තිබුණි. | ව්‍යාපෘතිය ලාභ ලබන තත්ත්වයට පත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2017 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කල වැල්ලවාය කොටිකම්බොක්ක තිරුවානා ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේද ආරම්භ කර නොතිබූ අතර කැණීම් කරන තිරුවානා ගබඩා කිරීම සඳහා ඉඩමක් බදු ගැනීම, කැණීම් කරන තිරුවානාවල බර කිරීම සඳහා පාලම් තරාදියක් මිලදී ගැනීම සහ එහි ආරක්ෂාව සඳහා සේවකයන් යෙදවීම ඇතුළු අයභාර සහ ප්‍රාග්ධන වියදම් ලෙස රු.21,712,327 ක මුදලක් 2017-2021 කාලය තුල දරා තිබුණි. | 2016 මැයි 10 දින අමාතයාංශ ලේකම්තුමාගේ ලිඛිත උපදෙස් ප්‍රකාරව උක්ත තිරුවානා නිධිය කැණීම් කර අලෙවි කිරීමට අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇත. ඒ අනුව අවශ්‍ය සියලුම ආයතනවල අනුමැතිය ඇතිව 201 ඔක්තෝබර් 13 දින සිට වලංගු වන පරිදි කාර්මික කැණීම් බලපත්‍රයක් ලබා ගෙන ඇත. එතැන් සිට සිදුකල යුතු අවම ගෙවීම් සිදුකර ඇත.<br>තවද මෙම ව්‍යාපෘතිය සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කල ප්‍රසම්පාදන කමිටුව වෙත එම ප්‍රසම්පාදනය සඳහා පත් කල තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව යොමු කර ඇති අතර ඒ අනුව එම පළමු කමිටු රැස්වීම 2022 මැයි 02 වන දින පරිසර අමාත්‍යාංශයේ පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇත. | ව්‍යාපෘතිය කඩිනමින් ආරම්භ කළයුතුය. |
| (ඉ) | වැලි කියුබ් 01 කින් රු.50 බැගින් කම්කරු සුභසාධනය සඳහා අයකර ගෙන තිබූ රු.5,616,811 ක මුදලක් සුභසාධනය සඳහා වැය නොකර අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සමාගමේ ආදායමට ගෙන තිබුණි | පුනරුත්ථාපනය සඳහා හෝ සුභසාධනය උදෙසා රැස්කරගන්නා හෝ රැස්කරගත් මුදල් අවශ්‍ය අවස්ථාවකදී වියදම් කිරීම ඉහත සඳහන් පරිදි චක්‍රලේඛ හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත සිදුකෙරෙන අතර එම රැස්කරගත් මුදල් අනිවාර්යයෙන් වියදම් කළ යුතු යැයි කොන්දේසියක් නොමැත. | නිශ්චිත අරමුණක් වෙනුවෙන් ආරම්භ කරන ලද අරමුදල් එම නිශ්චිත අරමුණ වෙනුවෙන් යොදවා ගත යුතුය. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2001 ජුනි 08 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සමාගමේ කාර්ය මණ්ඩලය ප්‍රධාන විධායක නිලධාරි ඇතුළු 5-6 කට සීමා විය යුතු බවත් ව්‍යාපෘති සඳහා අවශ්‍ය සේවකයන් කොන්ත්‍රාත් පදනම මත ලබා ගත යුතු බවට අනුමැතියක් ලබාදී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට 240 ක් වූ සේවක පිරිසක් කොන්ත්‍රාත් පදනම මත සේවය කරන අතර ස්ථිර කාර්ය මණ්ඩලය 64 ක් දක්වා වැඩිකර ගැනීමට සමාගම මගින් කෙටුම්පත කැබිනට් මණ්ඩල පත්‍රිකාවක් සකසා 2021 ජනවාරි 21 දින රේඛීය අමාත්‍යාංශයට ඉදිරිපත් කර තිබුණද 2022 පෙබරවාරි 28 දින වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. | අමාත්‍යාංශය අනුමැතිය ලද වහාම රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතේ සඳහන් උපදෙස් පරිදි රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තනේතුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත පිටපතක් සහිතව ආයතනයේ සංවිධාන සටහන හා බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අනුමැතිය ලබා ගැනිමට අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා වෙත යොමු කරනු ලැබේ. | අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |